# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2032/33 - 2017 අගෝස්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2017.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස - (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

2 වන සංශෝධනය

අංක 1971/17 දරන 2016.06.15 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධිත, අංක 1880/26 දරන 2014. 09.19 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 අගෝස්තු මස 17 වැනි දින.

(01) 6.1 උප ඡෙදය යටතේ සඳහන් වගුව ඉවත් කර ඒ වෙනුවට නව 6.1 වගුව ආදේශ කෙරේ.

කෘෂි සංවර්ධන, කෘෂි පර්යේෂණ, කෘෂි ආර්ථික විද්‍යා හා පොදු ධාරාව යටතේ අනුමත තනතුරු සංඛ්‍යාව

| *ශ්‍රේණිය* | *වැටුප් කේතය* | *කෘෂි සංවර්ධන ධාරාව* | *කෘෂි පර්යේෂණ ධාරාව* | *කෘෂි ආර්ථික විද්‍යා ධාරාව* | *පොදු ධාරාව (ධාරා එකකට වැඩි ගණනකට අයත්)* | *තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|---|---|---|---|
| විශේෂ | SL-03-2006 | 1 | - | - | 4 | 5 |
| I | SL-01-2006 | 47 | 50 | 2 | 38 | 137 |
| II | SL-01-2006 | 84 | 28 | 2 | 28 | 142 |
| II/III | SL-01-2006 | 126 | - | 1 | 4 | 131 |
| III | SL-01-2006 | 342 | 382 | 23 | - | 747 |

**6.2 උප ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.**

ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- 1157

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම සඳහා 111, 11 හා I ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**(2) 7.1 හි සටහන 2 ඉවත් කර ඒ වෙනුවට නව සටහන 2 ආදේශ කෙරේ.**

*සටහන 2* - එක් එක් ධාරාවන් යටතේ වන තනතුරු සංඛ්‍යාවන් පහත පරිදි වේ. එක් එක් ධාරාව යටතේ වන තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගනු ලැබේ.

| | | |
|---|---|---|
| කෘෂි සංවර්ධන | - | 472 |
| කෘෂි පර්යේෂණ | - | 382 |
| කෘෂි ආර්ථික විද්‍යා | - | 24 |

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ අනුමත කර ඇති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II/ III ශ්‍රේණිවලට අයත් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ තනතුරු 4 ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය යටතේ අනුමත සේවක සංඛ්‍යාව ගැලපීමේ දී කෘෂි සංවර්ධන ධාරාවට අයත් සේ සලකා 472 ක් ලෙස එම සේවක සංඛ්‍යාව යටතේ ඇතුළත් කර ඇත.

**(3) පළමු උපලේඛනයේ ඇතුළත් වගුවේ "අනු අංක 6" හා "අනු අංක 19" පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.**

| අනු අංකය | අනුමත තනතුරු නාම | ආයතනය | තනතුරු සංඛ්‍යාව | අයත් ධාරාව | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 6 | අධ්‍යක්ෂ (කෘෂි හා ගොවිජන සේවා සංවර්ධන) | කෘෂිකර්ම අමාත්‍යාංශය | 04 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | I |
| | අධ්‍යක්ෂ (කෘෂි යෙදවුම් කළමනාකරණ) | | | | |
| | අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණ) | | | | |
| | අධ්‍යක්ෂ (හවුල්කාරකත්ව හා සබඳතා) | | | | |
| 19 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (කෘෂි හා ගොවිජන සේවා සංවර්ධන) | කෘෂිකර්ම අමාත්‍යාංශය | 04 | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | II/ III |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (කෘෂි යෙදවුම් කළමනාකරණ) | | | | |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණ) | | | | |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති) | | | | |

08 - 1103

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.